*සැ. යු.* - 2023.07.14 දින පළ කරන ලද අංක 2,341 *ගැසට් පත්‍රයේ* I/11(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,342 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 756 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 742 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 743 |

*සැ. යු.*- (i) විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අගෝස්තු මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූලි මස 28 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

755- B 82476 — 5,403 (2023/07)

# පළාත් පාලන නිවේදන

## පානදුර නගර සභාව

1949 අංක 55 දරන නගර සභා ආඥාපනතේ 44 (1 හා 2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1949 අංක 55 දරන නගර සභා ආඥාපනතේ 44 (1 හා 2) වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් පානදුර නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (2023.01.05 වැනි දින *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවේදන යටතේ පළ කරන ලදී.)

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවූ බැවින් උපලේඛනයේ සඳහන් පාරවල් පානදුර නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. මානෙල් සියඹලාගොඩ,
ලේකම් හා පානදුර නගර සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

**නම් කිරීම සඳහා අනුමත වූ මාර්ග *ගැසට් පත්‍රයේ* පළ කිරීම**

| *අනු. අංකය* | *වීථියේ වර්තමාන නම* | *අලුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තරය* |
|---|---|---|---|
| 01 | කුරුප්පුමුල්ල ගාමිණි කොස්තා මාවත ඉදිරිපිට පිහිටි අතුරු මාර්ගය | නෙළුම් පටුමග | 682ඒ, කුරුප්පුමුල්ල කොට්ඨාසයේ පිහිටා ඇති, වරිපනම් අංක 75 න් ආරම්භ වී වරිපනම් අංක 73/3 න් අවසන් වන දිගින් මීටර් 178.0 ක් හා පළලින් මීටර් 4.5/6.0 ක ප්‍රමාණයෙන් යුත්, කුරුප්පුමුල්ල ගාමිණි කොස්තා මාවත ඉදිරිපිට ඇති අතුරු මාර්ගය |
| 02 | කුරුප්පුමුල්ල අතුරු මාර්ගය (කුරුප්පුමුල්ල කොනාර බේකරිය ඉදිරිපිට පාර) | ඕලු පටුමග | 682ඒ, කුරුප්පුමුල්ල කොට්ඨාසයේ පිහිටා ඇති, වරිපනම් අංක 51 න් ආරම්භ වී වරිපනම් අංක 158/බී/5 න් අවසන් වන දිගින් මීටර් 72.86 ක් හා පළලින් මීටර් 3.0/4.0 ක ප්‍රමාණයෙන් යුත්, කුරුප්පුමුල්ල අතුරු මාර්ගය |
| 03 | කවිරාජ මාවත 9 වන අතුරු මාර්ගය | දහම් මාවත | 689 ඒ, මොරවින්න කොට්ඨාසයේ පිහිටා ඇති, කවිරාජ මාවත, වරිපනම් අංක 66න් ආරම්භ වී වරිපනම් අංක 68/1 න් අවසන් වන දිගින් මීටර් 121.0 ක් හා පළලින් මීටර් 5.79 ක ප්‍රමාණයෙන් යුත්, කවිරාජ මාවත 9 වන අතුරු මාර්ගය |
| 04 | දෙවට පාර | රණවිරු වසන්ත කුමාරසිරි මාවත | 679, වලාන කොට්ඨාසයේ පිහිටා ඇති, ගාලු පාර, වරිපනම් අංක 122 න් ආරම්භ වී වරිපනම් අංක 122/5 ඒ ස්ථානයෙන් අවසන්-වන දිගින් මීටර් 105.5 ක් හා පළලින් මීටර් 2.75/3.7 ක ප්‍රමාණයෙන් යුත්, දෙවට පාර |
| 05 | කුරුප්පුමුල්ල අතුරු මාර්ගය (කුරුප්පුමුල්ල ප්‍රධාන පාරේ ජේසන් පීරිස් මාවත පසුකල විට වම්පසට ඇති පළමු පාර) | සමාධි මාවත | 682, කුරුප්පුමුල්ල කොට්ඨාසයේ පිහිටා ඇති, වරිපනම් අංක 127/7 න් ආරම්භ වී වරිපනම් අංක 131/1 න් අවසන් වන දිගින් මීටර් 77.44 ක් හා පළලින් මීටර් 5.03/4.88 ක ප්‍රමාණයෙන් යුත්, කුරුප්පුමුල්ල ප්‍රධාන මාර්ගය |
| 06 | කවිරාජ මාවත 7 වන අතුරු මාර්ගය (කම්මල පාර) | එකමුතු පෙදෙස | 687, වෑකඩ බටහිර කොට්ඨාසයේ පිහිටා ඇති, කවිරාජ මාවත වරිපනම් අංක 54 න් ආරම්භ වී වරිපනම් අංක 56/7න් අවසන් වන දිගින් මීටර් 130.0 ක් හා පළලින් මීටර් 6.0 ක ප්‍රමාණයෙන් යුත්, කවිරාජ මාවත 7 වන අතුරු මාර්ගය (කම්මල පාර) |

| අනු. අංකය | වීථියේ වර්තමාන නම | අලුතින් යොදා ඇති නම | මාර්ග විස්තරය |
|---|---|---|---|
| 07 | | ද සිල්වා පෙදෙස | 682බී, ඇටඹගොඩ කොට්ඨාසයේ පිහිටා ඇති, වරිපනම් අංක 115 A න් ආරම්භ වී වරිපනම් අංක 115/4 න් අවසන් වන දිගින් මීටර් 75.6 ක් හා පළලින් මීටර් 4.50/4.8ක ප්‍රමාණයෙන් යුත්, ඇටඹගොඩ ශ්‍රී චන්ද්‍රසේකර මාවත ඉදිරිපිට ගල් අල්ලා ප්‍රතිසංස්කරණය කරන ලද අතුරු මාර්ගය |

07-191/1

---

## පානදුර නගර සභාව

### 1949 අංක 55 දරන නගර සභා ආඥාපනතේ 44 (1 හා 2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1949 අංක 55 දරන නගර සභා ආඥාපනතේ 44 (1 හා 2) වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් පානදුර නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (2023.01.05 වැනි දින *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවේදන යටතේ විරෝධතා කැඳවීමේ නිවේදනය පළ කරන ලදී.)

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවූ බැවින් උපලේඛනයේ සඳහන් පාරවල් පානදුර නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. මානෙල් සියඹලාගොඩ,
ලේකම් හා පානදුර නගර සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

**පවරා ගැනීම සඳහා අනුමත වූ මාර්ග *ගැසට් පත්‍රයේ* පළ කිරීම**

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය | ග්‍රාම නිලධාරී වසම | පාරේ දිග (මීටර්) | පාරේ පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|
| 01 | පානදුර, නල්ලුරුව, වරිපනම් අංක 741/8 සහ 741/7 යන නිවෙස්වලින් ආරම්භ වී ඇති මාර්ගය කෙළවර පිහිටි හැරවුම් වෘත්තයෙන් පසු පිහිටි නල්ලුරුව සිරිල් සල්ගාදු මාවතේ පළමු පටුමග වරිපනම් අංක 341/සී සිට ඉදිරියට ඇති මාර්ගය | වරිපනම් අංක 741/8 හා 741/7 | වරිපනම් අංක 741/4සී හා 741/5 සී | අංක 692ඒ, නල්ලුරුව උතුර | 38.11 | 3.96 |
| 02 | පානදුර රත්නපුර මාර්ගයේ ජාතික තරුණ සේවා සභාව අසලින් ආරම්භ වී දොස්තර නෙවිල් ප්‍රනාන්දු පාර අසලින් අවසන් වන මාර්ගය | වරිපනම් අංක 94, 94/3 (දකුණත) | වරිපනම් අංක 108, 108/1 (වමත) | අංක 686 පට්ටිය දකුණ | 153.35 | 10.98-7.93 |
| 03 | නල්ලුරුව සිරිල් සල්ගාදු මාවතේ දකුණු පසට ඇති අතුරු මාර්ගය | වරිපනම් අංක 741/12 සහ 741/13 | වරිපනම් අංක 747/12 ඒ | අංක 692ඒ, නල්ලුරුව උතුර | 70.73 | 4.98-5.79 |
| 04 | පානදුර මෝදරවිල පාරේ, කැරපන් ඇළ අසලින් හැරී පළමු කොන්ක්‍රීට් පාලම ඇතුළත අඩක් නිමකර ඇති මාර්ගය | වරිපනම් අංක 34/5 න් | වරිපනම අංක 34/12 | අංක 692ඒ, නල්ලුරුව උතුර | 96.65 | 3.05 |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය | ග්‍රාම නිලධාරි වසම | පාරේ දිග (මීටර්) | පාරේ පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|
| 05 | පානදුර ගාළු පාරේ (අංක 868, උයන්කැලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ) ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය අසල පිහිටා ඇති වරිපනම් අංක 622, 612/5, 612/2, 612/3 නිවෙස් පිහිටා ඇති කෙටි මාර්ගය | වරිපනම් අංක 622 | වරිපනම් අංක 612/3 | අංක 868, උයන්කැලේ | 54.27 | 4.42 |
| 06 | ද සිල්වා මාවතේ අංක 40/7, 40, 40/8, 40/7ඒ, 40/11, 40/2, 40/5, 40/6 යන නිවාසවල පදිංචිකරුවන්ගේ පිවිසුම් මාර්ගය | වරිපනම් අංක 40 | වරිපනම් අංක 40/7 | අංක 683බී ඇටඹගොඩ | 79.88 | 4.88 |
| 07 | පානදුර ගාලු පාරේ අංක 653 යටතේ වූ පදිංචිකරුවන්ගේ භාවිතය සඳහා වූ මාර්ගය | වරිපනම් අංක 653 | වරිපනම් අංක 653/7 | අංක 686 පට්ටිය දකුණ | 111.89 | 6.10 |

07-191/2

---

## කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

### දියුණුකළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 2022/132 යටතේ සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන එල්. එච්. වී. ඉරෝෂණී වන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.


එල්. එච්. වී. ඉරෝෂණී,
පළාත් පාලන සහකාර කොමසාරිස්.

2023 මැයි මස 17 වැනි දින,
අනුරාධපුර,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූද, පහත උපලේඛනයේ ඇතුළත් කර ඇති සිතියමෙන් හා ඒ සමග විස්තර කෙරෙන සීමාවන් ඇතුළත පිහිටිය වූද, ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ද, මේ යෝජනා සම්මතය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු බවට සහ එකී ප්‍රදේශයේ පිහිටියා වූ සියලු නිශ්චල දේපළවල සහ නිශ්චල දේපළ වර්ගවල වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමටත්, එසේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම් මත වරිපනම් නියම කිරීමටත් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු මැද පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු යැයි, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

## Kebithigollewa Rate Area - Kebithigollewa PS



Esential Coordinates Within the Area

| Id | X | Y |
|---|---|---|
| 1 | 8.63009 | 80.65962 |
| 2 | 8.63858 | 80.64496 |
| 3 | 8.64952 | 80.67828 |
| 4 | 8.64516 | 80.66482 |
| 5 | 8.63119 | 80.66059 |
| 6 | 8.63364 | 80.61625 |
| 7 | 8.63413 | 80.66252 |
| 8 | 8.63479 | 80.66300 |
| 9 | 8.63559 | 80.66451 |
| 10 | 8.63584 | 80.66531 |
| 11 | 8.63734 | 80.66584 |
| 12 | 8.63881 | 80.66696 |
| 13 | 8.63906 | 80.66749 |
| 14 | 8.63957 | 80.66831 |
| 15 | 8.64001 | 80.66724 |
| 16 | 8.64134 | 80.66731 |
| 17 | 8.64196 | 80.66625 |
| 18 | 8.64483 | 80.66441 |
| 19 | 8.64554 | 80.66556 |
| 20 | 8.64333 | 80.66710 |
| 21 | 8.64258 | 80.66782 |
| 22 | 8.64199 | 8066969 |
| 23 | 88.6432 | 80.67017 |
| 24 | 8.64342 | 80.67144 |
| 25 | 8.64761 | 80.67455 |
| 26 | 8.64886 | 80.67603 |
| 27 | 8.69874 | 80.67670 |
| 28 | 8.64828 | 80.67755 |
| 29 | 8.64740 | 80.67722 |
| 30 | 8.64360 | 80.67357 |
| 31 | 8.64473 | 80.67445 |
| 32 | 8.64117 | 80.67138 |
| 33 | 8.64034 | 80.67240 |
| 34 | 8.64034 | 80.6724 |
| 35 | 8.63872 | 80.67577 |
| 36 | 8.63785 | 80.67533 |
| 37 | 8.63853 | 80.67401 |
| 38 | 8.63923 | 80.67270 |
| 39 | 8.63971 | 80.67070 |
| 40 | 8.63908 | 80.66936 |
| 41 | 8.63810 | 80.66736 |
| 42 | 8.63552 | 80.66591 |
| 43 | 8.63962 | 80.66416 |
| 44 | 8.63060 | 80.66116 |

Special Places Within the Area

| Place | Name |
|---|---|
| A | School |
| B | Ground |
| C | Police |
| D | Hospital |
| E | Predeshiya sabha |
| F | Temple |
| G | D.S.Office |
| H | Zonal edu office |

Legend

- Esential Coordinates
- Special Places
- Rate Area

## නාවලපිටිය නගර සභාව

ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනතේ 11 වන වගන්තිය අනුව සිදු කරනු ලබන නිවේදනයයි

නාවලපිටිය නගර සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බටහිර ග්‍රාම නිලධාරි වසම ජලභීතිකා රෝග බියක් ඇති ප්‍රදේශයක් බව ප්‍රකාශයට පත් කරමි.

ඩී. එම්. ඩී. බී. බී. දිසානායක
ලේකම්,
නාවලපිටිය නගර සභාව.

07-214

---

## හම්බන්තොට පළාත් පාලන කාර්යාලය

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවකට ලැබී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.12 යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උප වගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් අමාලි උපමාලිකා සංජීවනී ගුණසේකර වන ම විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

5.1.12 1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගනතියේ (1) වන උපවගන්තිය අනුව හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිසිලසගම, වලව, මානප්ජාව, දෙහිගහලන්ද ග්‍රාම නිලධාරි වසම් දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ අනුමැතිය පහත උපලේඛන පරිදි ලබා ගැනීම සුදුසු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

**ග්‍රාම නිලධාරි වසම් සහ අංක**

I. වලව ග්‍රාම නිලධාරි කොට්ඨාසය (125)
   - වලව, මැදගම, ජුල්පල්ලම, සුපිරින්ටන්ගම

II. දෙහිගහලන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය (127)
   - දෙහිගහලන්ද (කොටසක්), කරිවිලේ, මැදගම ගම් විශාල, බොරලුකන්ද, ගල්ඇන්ද

III. සිසිලසගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය (124)
   - සිසිලසගම, චිත්‍රාගල (කොටසක්)

IV. ගොඩවාය ග්‍රාම නිලධාරි කොට්ඨාසය (126)
   - ගොඩවාය, පයිබොක්ක, දෙහිගහලන්ද (කොටසක්)

V. මානප්ජාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය (128)
   - මානප්ජාව, මැඩිල්ල, චිත්‍රාගල (කොටසක්)

අමාලි යූ. එස්. ගුණසේකර,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මැයි මස 19 වැනි දින,
හම්බන්තොට පළාත් පාලන කාර්යාලයේ දී ය.

07-278

## මාතර මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය යටතේ විරෝධතා කැඳවීම

මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ මාතර මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මාතර මහ නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් මාතර මහ නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කාංචනා කේ. තල්පාවිල,
නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2023 මැයි මස 19 වැනි දින,

| *අංක* | *පාරේ නම* | *L/R* | *ආරම්භය* | *අවසානය* | *ශ්‍රේණිය* | *තාර (m)* | | *කොන්ක්‍රීට් (m)* | | *කාපට් (m)* | | *අන්.සම.ග (m)* | | *බොරළු (m)* | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | *දිග* | *පළල* | *දිග* | *පළල* | *දිග* | *පළල* | *දිග* | *පළල* | *දිග* | *පළල* |
| 1 | සිරිසේන ගුණතිලක මාවත දකුණු පස පළවෙනි පටුමග | R | නිහාල් මයාගේ නිවස (වරිපනම් අංක 163) | ක්‍රිෂාන්ති මියගේ නිවස (වරි. අංක 167/12) | | | | | | | | | | 150.00 | 4.50 |
| 2 | සම්පත් පෙදෙසෙ හි වංගුවේ ඇති බුදු පිළිමය ළඟින් දකුණට ඇති මාර්ගය (පළමු අතුරු මාර්ගය) | R | බුදු පිළිමය අසල සිට | අජිත් මයාගේ නිවස ඉදිරිපිට | C | 90.00 | 4.50/ 3.00 | | | | | | | | |

07-232

# විවිධ දැන්වීම්

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 350 යටතේ මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, 2024 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,<br>ලේකම්,<br>අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,<br>අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2024 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) වැනි කොටසේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රුපියල් පනහ (රු. 50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද මම යෝජනා කරමි.

07 - 173/1

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 351 යටතේ මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද 2024 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1659 හා 2010.06.18 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2017 යන වර්ෂවල සිදු කරන ලද තක්සේරු 2024 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමටත්

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්,

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද සමාන වාරික හතරකින් අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්,

එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙ හි එක් එක් කාර්තුව ඉදිරියේ III තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල අලව්ව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද අලව්ව ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් මම යෝජනා කරමි.

උපලේඛනය

| *I තීරුව*<br>*කාර්තුව* | *II තීරුව*<br>*ගෙවිය යුතු දිනය* | *III තීරුව*<br>*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2024.03.31 | 2024.01.31 |
| දෙවන කාර්තුව | 2024.06.30 | 2024.04.30 |
| තුන්වන කාර්තුව | 2024.09.30 | 2024.07.31 |
| හතරවන කාර්තුව | 2024.12.31 | 2024.10.31 |

07 - 173/2

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 352 යටතේ මම තීරණය කරමි.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,<br>
ලේකම්,<br>
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,<br>
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම යෝජනා කරමි.

උපලේඛනය

| | | *I* තීරුව | *II* තීරුව |
|---|---|---|---|
| | | | රු. ශත |
| (1) | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා- | |
| | | (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | | (ආ) වෙළඳ කාර්යය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 00 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| | (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| | (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

07 - 173/3

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වන වගන්තිය ප්‍රකාරව, 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 353 යටතේ මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද වාහන නතර කර තැබීමේ වලංගු අවසර පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව, 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයකට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2010.07.16 වැනි දින අංක 1663 දරන *ගැසට් පත්‍රයේ,* වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 2011.07.22 අංක 1716 *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළකරනු ලැබූ අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සම්බන්ධයෙන් පහත උපලේඛනය පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකළ යුතු බවත්, එකී ගාස්තුව ගෙවිය යුතු තැනැත්තෙකු විසින් 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, මම යෝජනා කරමි.

***උපලේඛනය***

| | | රු. ශත |
|---|---|---|
| 01. | වාහනය ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 100 0 |
| 02. | කාර්, වෑන් සහ ත්‍රී රෝද රථ සඳහා මාසික ගාස්තුව | 100 0 |
| 03. | බර වාහන සඳහා මාසික ගාස්තුව | 125 0 |
| 04. | ට්‍රැක්ටර්. අත් ට්‍රැක්ටර් සඳහා මාසික ගාස්තුව | 75 0 |

07 - 173/4

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 154 (3) වගන්තිය විධිවිධාන ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 354 යටතේ මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ බදු සහ ගාස්තු, ඉඩම් වෙන්දේසි කරනු ලබන වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව. අලව්ව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් හා අංක 1882/22 හා 2014.10.01 දිනැති ඉඩම් කට්ටි කිරීමේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තියේ සඳහන් සංවර්ධන සැළැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. (එසේ වුව ද නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ඉඩම් අනුබෙදුම් කිරීම, ඒකාබද්ධ කිරීම හා සංවර්ධනය කිරීමේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54 - 2021/07/08 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අය කළයුතු ය.)

උපලේඛනය

| *ඉඩමේ ප්‍රමාණය* | *සංවර්ධන සැළැස්ම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* | *අනුබෙදුම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| හෙක්ටයාර් 01 ට අඩු | 500 0 | 500 0 |
| හෙක්ටයාර් 01 ට වැඩි 02 දක්වා | 700 0 | 700 0 |
| හෙක්ටයාර් 02 ට වැඩි 04 දක්වා | 1,000 0 | 1,000 0 |
| හෙක්ටයාර් 04 ට වැඩි | 1,250 0 | 1,250 0 |

07 - 173/5

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වන වගන්තිය ප්‍රකාරව ,126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රචාරක දන්වීම් සඳහා ගාස්තුවක් අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 355 යටතේ මම තීරණය කරමි. එනම්

2024 වර්ෂය සඳහා පනවන ලද එම ගාස්තුව, දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

## යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන ඒ බව 1998.08.28 වැනි දින අංක 1043 ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළකරනු ලැබූ අතර, එම අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. (එසේ වුවද නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ප්‍රචාරක දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීමේ දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54 - 2021/07/08 අති විශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අයකළ යුතු ය.)

### *උපලේඛනය*

| | *ප්‍රචාරක දැන්වීම් විස්තරය* | *අවසර පත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01. | ප්‍රචාරක වෙළඳ දැන්වීමක්, පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ස්ථානයක සවි කිරීමේ දී එක් හතරැස් අඩියකට (ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා) වසරකට | 150 0 |
| 02. | යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කර ඇති හෝ මහජනතාවට දැනගැනීමට හැකි වන පරිදි හෝ යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට (තාවකාලික දැන්වීමක් සඳහා) - මසකට | 50 0 |
| 03. | වෙන්දේසි ඉඩම් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට - මසකට | 100 0 |

07 - 173/6

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටුකරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව පරිසර බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 356 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද එම බලපත්‍ර ගාස්තුව හා පරීක්ෂණ ගාස්තුව, පරිසර බලපත්‍රය ලබාදීමට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන යම් ව්‍යාපාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු යම් තැනැත්තෙකු ගෙන්, පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් හා පරීක්ෂණ ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබාගැනීමට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි.

උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | නියමිත පරිදි සකස් කරන ලද ප්‍රශ්නාවලිය සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| | බලපත්‍ර අලුත්කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| | බලපත්‍ර ගාස්තුව | 1,250 0 |
| 02. | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුව : | |

| මූලික ආයෝජනය | රු. ශත |
|---|---|
| රු. 1,00,000 දක්වා | 250 0 |
| රු. 1,00,001 සිට 2,00,000 දක්වා | 500 0 |
| රු. 2,00,001 සිට 5,00,000. දක්වා | 1,250 0 |
| රු. 5,00,001 සිට 1,000,000 දක්වා | 2,500 0 |
| රු. 1,000,001 සිට ඉහළට | 5,000 0 |

07 - 173/7

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටුකරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ලබා දෙනු ලබන සහතිකයක් හෝ සේවාවක් වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 357 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද සභාව විසින් නිකුත් කරනු ලබන සහ සහතික හා ලබාදෙනු ලබන සේවාවන් සඳහා පනවනු ලැබූ එකී ගාස්තු ඒ සේවාව හෝ සහතිකය ලබාගැනීමට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,<br>
ලේකම්,<br>
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,<br>
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබාදීම සඳහා එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී සේවාව හෝ සහතිකය ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබාගැනීමට පෙර එම ගාස්තුව අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි. (එසේ වුවද නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලද අංක 2235/54 - 2021/07/08 අති විශෙෂ *ගැසට් පත්‍රයේ* සඳහන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවල සඳහන් ගාස්තු අය කළ යුතු ය.)

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | *රු. ශත* |
| 01. වීථිරේඛා සහ නොපවරවා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික සහ හිමිකම් සහතික සඳහා | 600 0 |
| ඒ සඳහා වන තැන්පත් මුදල | 100 0 |
| 02. දේපළ අයිතිය හැරවීම, වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම, ඉල්ලුම්පත් හා වෙනත් සහතික පත්‍රයක් සඳහා | 250 0 |
| 03. ගොඩනැගිලි අනුකූලතා සහතිකයක් සඳහා | 1,000 0 |
| 04. ගොඩනැගිලි අයදුම්පත්‍රවල වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම සඳහා | 1,000 0 |
| 05. ගොඩනැගිලි අයදුම්පතක් සඳහා | 500 0 |

06. ගොඩනැගිලි අයදුම්පත අනුමත කිරීමේ දී පෙරසැරි ගාස්තු -

| *ගොඩනැගිල්ලේ විශාලත්වය (වර්ග අඩි)* | *වර්ග අඩියකට ගාස්තුව* | |
|---|---|---|
| | *නේවාසික* | *ව්‍යාපාරික* |
| | *රු. ශත.* | *රු. ශත* |
| * 500ට අඩු | 1.00 | 1.50 |
| * 501 - 1000 | 1.50 | 2.00 |
| * 1001 - 2000 | 2.00 | 2.50 |
| * 2001 - 3000 | 2.50 | 3.00 |
| * 3001 - 5000 | 3.00 | 3.50 |
| * 5001 - 10,000 | 3.50 | 4.00 |
| * 10,000 ට වැඩි | 5.00 | 6.00 |
| * උස අඩි 5 ට අඩු තාප්පයකට (දික් අඩි 1ක් සඳහා) | 10.00 | 10.00 |
| * උස අඩි 5 ට වැඩි තාප්පයකට (දික් අඩි 1ක් සඳහා) | 15.00 | 15.00 |
| * බැම්මක් බැඳීමට (දික් අඩි 1ක් සඳහා) | 10.00 | 10.00 |

07. නීත්‍යානුකූල කළ හැකි අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කිරීමේ ගාස්තු.
(ඉහත සඳහන් ගාස්තුවලට අමතරව අයකරනු ලබන ගාස්තු)

| | *වර්ග අඩියකට ගාස්තුව (රු.)* | |
|---|---|---|
| | *නේවාසික* | *ව්‍යාපාරික* |
| | *රු. ශත* | *රු. ශත* |
| (අ) අත්තිවාරම අවසානය දක්වා ඉදිකර ඇති විට | 1 50 | 2 00 |
| (ආ) ඉදිකිරීම් අඩක් නිමකර ඇති විට | 2 00 | 2 50 |
| (ඇ) ඉදිකිරීම් නිම කිරීමෙන් පසු | 3 00 | 3 50 |

08. දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම :

උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකට ම රු. 100 බැගින්

| | *රු. ශත* |
|---|---|
| 09. ඉඩම් කට්ටි කිරීමේ ඉල්ලුම්පත්‍රයක් සඳහා | 1,000 0 |
| 10. අගරු චෙක්පතක් සඳහා දඩ මුදල් | 100 0 |
| 11. පිඹුරුපතක් අනුමත කිරීමේ ගාස්තු | 500 0 |
| 12. වරිපනම් ලේඛනයේ උපුටන ලබා ගැනීම, දේපළ තක්සේරු ලේඛනයක් සඳහා | 500 0 |
| 13. වරිපනම් නොගෙවන බවට සහතිකයක් ලබාදීම සඳහා | 100 0 |
| 14. නැතිවූ සහතිකයක පිටපතක් ලබාගැනීම සඳහා | 200 0 |

| | | රු. ශත |
|---|---|---|
| 15. | අනතුරුදායක ගසක් ඉවත් කිරීම සඳහා වන අයදුම්පතක් සඳහා | 500 0 |
| | අනතුරුදායක ගස් පරීක්ෂණ ගාස්තු | 500 0 |
| 16. | ජල බවුසරය කුළියට දීම සඳහා ගාස්තු : | |
| | (i) ස්ථාවර ගාස්තුව | 2,100 0 |
| | (ii) වැඩිවන සෑම බවුසරයක් සඳහා ම | 700.0 බැගින් |
| | (iii) ජල ප්‍රවාහන ගාස්තුව කිලෝ මීටර් 01ක් සඳහා (යාම් ඊම් වෙනුවෙන්) | 360 0 |
| 17. | කාබනික පොහොර (කොම්පෝස්ට් පොහොර) කිලෝ එකක් සඳහා | 15 0 |
| | (එකවර කලෝ 1000 කට වැඩ ප්‍රමාණයක් මිලදී ගනු ලබන්නේ නම් 20% වට්ටමක් දෙනු ලැබේ.) | |
| 18. | කොඩිකණු සඳහා ගාස්තු : | |
| | පැය 12ක් හෝ 12කට අඩු කාලයක් සඳහා | 40 0 |
| | පැය 12කට වැඩි පැය 24කට අඩු කාලයක් සඳහා | 60 0 |
| | එක් කොඩි කණුවක් සඳහා තැන්පත් මුදල | 200 0 |
| 19. | සභාව සතු අලව්ව බස් නැවතුම්පලට ඇතුළු කරන සෑම මගී ප්‍රවාහන බස් රථයකින් ම දිනකට එක්වරක් පමණක් අයකරන ගාස්තුව | 50 0 |
| 20. | ජලනළ එලීමට මාර්ගය පළුදු කිරීම සඳහා ගාස්තුව : | |
| | තාර දමූ මාර්ග (වර්ග අඩියක් සඳහා) | 500 0 |
| | කොන්ක්‍රීට් දමූ මාර්ග (වර්ග අඩියක් සඳහා) | 400 0 |
| | බොරළු දමූ මාර්ග (වර්ග අඩියක් සඳහා) | 100 0 |
| | බොරළු දමූ මාර්ගයක මාර්ග උරහිස කැපීම (වර්ග අඩියක් සඳහා) | 100 0 |
| 21. | ගලි බවුසර සේවාව සඳහා අයකරනු ලබන ගාස්තුව | |
| | ස්ථාවර ගාස්තුව (පළමු ලෝඩ් එක සඳහා) | 4,000 0 |
| | වැඩිවන සෑම ලෝඩ් එකක් සඳහා | 2,100 0 |
| | රියදුරු හා සහායක දීමනා | 1,000 0 |
| | ප්‍රවාහන ගාස්තුව කිලෝමීටර් 01 ක් සඳහා (යාම් ඊම් වෙනුවෙන්) | 600 0 |
| 22. | පුස්තකාල මගින් අයකරනු ලබන ගාස්තු : | |
| | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 10 0 |
| | පුස්තකාල සාමාජික ගාස්තු - | |
| | ළමුන් සඳහා | 25 0 |
| | වැඩිහිටියන් සඳහා | 100 0 |
| | පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තු : | |
| | ළමුන් සඳහා | 25 0 |
| | වැඩිහිටියන් සඳහා | 50 0 |

ප්‍රමාදයන් සඳහා දඩ මුදල් අය කිරීම :

| | | | |
|---|---|---|---|
| 1. | දින 01 සිට දින 30 දක්වා එක් දිනකට එක් පොතකට | - | 2.00 බැගින් |
| 2. | දින 31 සිට දින 90 දක්වා එක් පොතකට | - | 80.00 |
| 3. | දින 91 සිට දින 180 දක්වා එක් පොතකට | - | 160.00 |
| 4. | දින 180 කට වැඩි දින සඳහා එක් පොතකට | - | 200.00 |
| 23. | ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමිවල මෘතදේහ තැන්පත් කිරීමේ ගාස්තු - වර්ග අඩි 1 ක් සඳහා | - | 1,000.00 |

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනත යටතේ පනවනු ලබන ගාස්තු

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම (176 වන අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ (31) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත සංදර්ශන බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 358 යටතේ මම තීරණය කරමි. එනම් ;

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ සංදර්ශන බලපත්‍ර ගාස්තුව, සංදර්ශනය පැවැත්වීමට දින තුනකට පෙර අලව්ව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනතේ (31) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මුදල් අයකර පෙන්වනු ලබන සංදර්ශන සඳහා පහත උපලේඛනයෙහි සඳහන් ගාස්තුවක් 2024 වර්ෂයට පනවා අයකල යුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් සංදර්ශනයට පැවැත්වීමට යටත් පිරිසෙයින් තෙදිනකට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, මම යෝජනා කරමි.

*උපලේඛනය*

01. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් හැර අනිකුත් සංදර්ශන සඳහා

| | රු. ශත |
|---|---|
| එක් දිනකට | 100 0 |
| එක් සතියකට | 500 0 |
| එක් මසකට | 1,500 0 |

02. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් සඳහා
එක් දිනකට රු. 1,000 0 බැගින්

07-173/9

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රජාශාලා සහ ක්‍රීඩාපිටි කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි හා ප්‍රජාශාලා කුළියට දීම වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 359 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද ප්‍රජා ශාලා සහ ක්‍රීඩා පිටි කුළියට දීමේ ගාස්තු එකී ස්ථාන ප්‍රයෝජනයට ගැනීමට පෙර අලව්ව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අලව්ව සහ බෝයවලාන ප්‍රජාශාලා ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පිළිවෙළින් පහත උපලේඛන අංක 01 සහ 02 හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ කුලී මුදලක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් මහජන ක්‍රීඩාංගණ සහ මහජන ක්‍රීඩාංගණ නොවන වෙනත් එළිමහන් ස්ථාන ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත උපලේඛන අංක 03 හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ කුලී මුදලක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, ප්‍රාදේශීය සභාවට අයත් ඉහත සඳහන් දේපල ප්‍රයෝජනයට ගනු ලබන යම් තැනැත්තෙක් එම දේපල ප්‍රයෝජනයට ගැනීමට පෙර අදාළ කුලී මුදල අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි.

**උපලේඛන අංක 01**

අලව්ව ප්‍රජාශාලාව කුලියට දීම

| අනු. අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු. ශත | පැය 6ක්/පැය 6කට අඩු කාලයක් සඳහා කුලී මුදල රු. ශත | පැය 6 කට වැඩි පැය 12ක් හෝ 12ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු. ශත | පැය 12ට වැඩි පැය 24ක් හෝ 24ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු. ශත |
|---|---|---|---|---|---|
| 01. | පොත් ප්‍රදර්ශනයක් සඳහා - | | | | |
| | (1) පළමු දින | | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| | (2) දෙවැනි දින | 5,000 0 | 2,400 0 | 4,800 0 | 7,200 0 |
| | (3) තෙවැනි දින | | 1,800 0 | 3,600 0 | 5,400 0 |
| 02. | ආබාධිතයන්ගේ උත්සවයක් සඳහා | 5,000 0 | 1,200 0 | 2,400 0 | 3,600 0 |
| 03. | වාණිජ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා | 5,000 0 | 3,600 0 | 7,200 0 | 10,800 0 |
| 04. | වාණිජ සල්පිලක් සඳහා | 5,000 0 | 3,600 0 | 7,200 0 | 10,800 0 |
| 05. | ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා | 5,000 0 | 1,200 0 | 2,400 0 | 3,600 0 |
| 06. | රූපලාවන්‍ය ප්‍රදර්ශනයක් සඳහා | 5,000 0 | 2,400 0 | 4,800 0 | 7,200 0 |
| 07. | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයට අයත්) | 5,000 0 | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| 08. | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයෙන් පිටත) | 5,000 0 | 4,200 0 | 7,700 0 | 12,600 0 |
| 09. | රැස්වීමක් සමඟ සුහද හමුවක් සඳහා | 5,000 0 | 1,800 0 | 3,600 0 | 5,400 0 |
| 10. | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය නොකරන) | 5,000 0 | 2,400 0 | 4,800 0 | 7,200 0 |
| 11. | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය කරන) | 5,000 0 | 3,600 0 | 7,200 0 | 10,800 0 |
| 12. | පෙර පාසල් උත්සවයක් සඳහා | 5,000 0 | 1,800 0 | 3,600 0 | 5,400 0 |
| 13. | කරාටේ පංති පැවැත්වීම සඳහා | 5,000 0 | 2,400 0 | 4,800 0 | 7,200 0 |
| 14. | දානමය කටයුත්තක් සඳහා | 5,000 0 | 1,200 0 | 2,400 0 | 3,600 0 |
| 15. | නාට්‍ය/සංගීත සංදර්ශන සඳහා | 5,000 0 | 3,600 0 | 7,200 0 | 10,800 0 |
| 16. | ස්වයං රැකියා පිළිබඳ දැනුවත් කිරීමක් සඳහා | 5,000 0 | 1,200 0, | 2,400 0 | 3,600 0 |

උපලේඛන අංක 02

**බෝයවලාන ප්‍රජාශාලාව කුළියට දීම**

| අනු. අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු. ශත | පැය 6ක්/පැය 6කට අඩු කාලයක් සඳහා කුලී මුදල රු. ශත | පැය 6 කට වැඩි පැය 12ක් හෝ 12ට අඩු කාලයක් සඳහා කුලී මුදල රු. ශත | පැය 12ට වැඩි පැය 24ක් හෝ 24ට අඩු කාලයක් සඳහා කුළී මුදල රු. ශත |
|---|---|---|---|---|---|
| 01. | පොත් ප්‍රදර්ශනයක් සඳහා - | | | | |
| | (1) පළමු දින | | 2,400 0 | 4,800 0 | 7,200 0 |
| | (2) දෙවැනි දින | 5,000 0 | 1,500 0 | 3,000 0 | 4,500 0 |
| | (3) තෙවැනි දින | | 600 0 | 1,200 0 | 1,800 0 |
| 02. | ආබාධිතයන්ගේ උත්සවයක් සඳහා | 5,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |
| 03. | වාණිජ වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා | 5,000 0 | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| 04. | වාණිජ සල්පිලක් සඳහා | 5,000 0 | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| 05. | ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා | 5,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |
| 06. | රූපලාවන්‍යය ප්‍රදර්ශනයක් සඳහා | 5,000 0 | 1,200 0 | 2,400 0 | 3,600 0 |
| 07. | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයට අයත්) | 5,000 0 | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| 08. | විවාහ මංගල උත්සවයක් සඳහා (සභා බල ප්‍රදේශයෙන් පිටත) | 5,000 0 | 4,200 0 | 8,400 0 | 12,800 0 |
| 09. | රැස්වීමක් සමඟ සුහද හමුවක් සඳහා | 5,000 0 | 1,500 0 | 3,000 0 | 4,500 0 |
| 10. | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය නොකරන) | 5,000 0 | 700 0 | 1,400 0 | 2,100 0 |
| 11. | අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් සඳහා (ගාස්තු අය කරන) | 3,000 0 | 900 0 | 1,800 0 | 2,700 0 |
| 12. | පෙර පාසල් උත්සවයක් සඳහා | 3,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |
| 13. | කරාටේ පංති පැවැත්වීම සඳහා | 3,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |
| 14. | දානමය කටයුත්තක් සඳහා | 3,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |
| 15. | නාට්‍ය/සංගීත සංදර්ශන සඳහා | 3,000 0 | 3,000 0 | 6,000 0 | 9,000 0 |
| 16. | ස්වයං රැකියා පිළිබඳ දැනුවත් කිරීමක් සඳහා | 3,000 0 | 600 0 | 1,200 0 | 1,800 0 |

**උපලේඛන අංක 03**

**අලව්ව මහජන ක්‍රීඩාංගන සහ මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථාන කුළියට දීම**

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු. ශත | පැය 12ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළී මුදල රු. ශත | පැය 12ට වැඩි පැය 24ක් හෝ 24ට අඩු කාලයක් සඳහා කුළී මුදල රු. ශත |
|---|---|---|---|---|
| 01. | සියලුම ප්‍රසිද්ධ මහජන රැස්වීම් සඳහා | 10,000 0 | 3,000 0 | 4,500 0 |
| 02. | මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 15,000 0 | 6,000 0 | 9,000 0 |
| 03. | නොමිලේ පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 20,000 0 | 4,000 0 | 6,000 0 |
| 04. | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරග හෝ උත්සව සඳහා | 5,000 0 | 6,000 0 | 9,000 0 |
| 05. | නොමිලේ පවත්වනු ලබන ක්‍රීඩා තරග හෝ උත්සව සඳහා | 5,000 0 | 4,000 0 | 6,000 0 |
| 06. | වාණිජ සල්පිල් සඳහා | 5,000 0 | 4,000 0 | 6,000 0 |
| 07. | ආගමික උත්සව/පෙර පාසල් උත්සව සහ වෙනත් උත්සව | 5,000 0 | 2,000 0 | 3,000 0 |
| 08. | මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථානයක් සඳහා- අලව්ව නාගරික බල ප්‍රදේශය තුල | | 3,000 0 | 4,500 0 |

**බෝයවලාන මහජන ක්‍රීඩාංගන සහ මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථාන කුළියට දීම**

| අනු අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු. ශත | පැය 12ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළී මුදල රු. ශත | පැය 12ට වැඩි පැය 24ක් හෝ 24ට අඩු කාලයක් සඳහා කුළී මුදල රු. ශත |
|---|---|---|---|---|
| 01. | සියලුම ප්‍රසිද්ධ මහජන රැස්වීම් සඳහා | 5,000 0 | 2,000 0 | 3,000 0 |
| 02. | මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 5,000 0 | 5,000 0 | 7,500 0 |
| 03. | නොමිලේ පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ එවැනි වෙනත් කාර්යයන් | 5,000 0 | 3,000 0 | 4,500 0 |
| 04. | මුදල් අයකර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හෝ උත්සව සඳහා | 2,500 0 | 5,000 0 | 7,500 0 |
| 05. | නොමිලේ පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හෝ උත්සව සඳහා | 2,500 0 | 3,000 0 | 4,500 0 |
| 06. | වාණිජ සල්පිල් සඳහා | 2,500 0 | 3,000 0 | 4,500 0 |
| 07. | ආගමික උත්සව/පෙර පාසල් උත්සව ඇති වෙනත් උත්සව | 2,500 0 | 1,500 0 | 2,000 0 |
| 08. | මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථානයක් සඳහා - බෝයවලාන/මහරච්චිමුල්ල ප්‍රදේශය තුල | | 1,500 0 | 2,000 0 |

සැ. යු. .-1. ප්‍රජාශාලාව දීර්ඝකාලීනව කුළියට දෙන්නේ නම් (සතියකට වැඩි කාලයක් සඳහා) ආරක්ෂිත ඇප මුදල රු. 5,000.00 අයකළ යුතු ය.

2. ප්‍රජාශාලාව කුළියට දීමේ දී වැයවන විදුලිය සඳහා අය කිරීම විදුලිබල මණ්ඩලය විසින් ඒකකයක් සඳහා කලින් කලට අය කරනු ලබන ගාස්තු මුදල අය කළ යුතුය.

07 - 173/10

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තියේ IV වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් ගාස්තුවක් අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 360 යටතේ මම තීරණය කරමි. එනම් ;

2024 වර්ෂය සඳහා පනවන ලද එම කසල ශෝධන ගාස්තුව, සෑම වර්ෂයකම අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වැනි වගන්තිය සහ 126 වැනි වගන්තියේ IX වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 2015.09.25 වැනි දින අංක 1933/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව, අලව්ව ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන 2016.03.18 වැනි දින අංක 1959 *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2024 වර්ෂය සඳහා පහත අංක 01 උපලේඛනයේ 01 වැනි තීරුවේ සඳහන් එම සේවාව පවත්වාගෙන යනු ලබන ගෘහස්ථ නොවන ඒකක හා වෙළඳ පරිශ්‍රවලින් එකී උපලේඛනයේ 02 වැනි තීරුවේ සඳහන් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමට සුදුසු බවට මම යෝජනා කරමි.

**අංක 01 උපලේඛනය**

| | *01 වැනි තීරුව* | *02 වැනි තීරුව*<br>*රු. ශත* |
|---|---|---|
| 01. | වීථියකට හෝ මංමාවතකට යාබදව පිහිටි ගසක් හෝ ගසක කොටසක් කපා ඇති විටක එය ඉවත් කිරීම සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා) | 1,000 0 |
| 02. | නිවාස පරිශ්‍රයන්වලින් බැහැර කරන සතුන්ගේ මළකුණු, ශරීර කොටස් - (එක් වරක් ප්‍රවාහනය සඳහා) | 1,000 0 |
| 03. | සාප්පු සහ කාර්යාල පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි සහ වෙනත් වියළි අපද්‍රව්‍ය සඳහා වාර්ෂික ගාස්තුව (තොග සහ සිල්ලර වෙළඳාම, ආහාරපාන අලෙවිය, රූපලාවන්‍ය සැලෝන්) | 600 0 |
| 04. | පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම නිසා ජනනය වන අපද්‍රව්‍ය (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව | 360 0 |
| 05. | කර්මාන්ත ශාලා මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා වාර්ෂික ගාස්තුව | 18,000 0 |
| 06. | කැණීම්, ඉදිකිරීම් හා කඩා දැමීම් මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා) | 1,000 0 |
| 07. | රජයේ ආරෝග්‍ය ශාලා පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව | 600 0 |
| 08. | පෞද්ගලික රෝහල් හා රසායනාගාර පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව | 6,000 0 |
| 09. | වෙනත් පරිශ්‍ර (ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500ට අඩු කුඩා ව්‍යාපාර) | 300 0 |

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 361 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන ලද එකී බද්ද සෑම වර්ෂයකම අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කලහැකි විටක එවැනි යම් ඉඩමක,

01. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,
02. ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් මම යෝජනා කරමි.

07 - 173/12

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම සඳහා ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරන කුලියට දීම වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 362 යටතේ මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම සඳහා වන ගාස්තුව එම සේවාව ලබාගැනීමට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ අංක 1හි 1 වැනි තීරුවේ සඳහන් වාහන හා යන්ත්‍ර කුළියට ලබාදීම සඳහා එම උපලේඛනයේ 2 වැනි තීරුවේ සහ 3 වැනි තීරුවේ සඳහන් කර ඇති ගාස්තුවකුත්, උපලේඛනයේ අංක 2හි 1 වැනි තීරුවේ සඳහන් වාහනය සඳහා 2 වැනි තීරුවේ සඳහන් ගාස්තුවත්, 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී සේවාව ලබාගන්නා යම් තැනැත්තෙකු විසින් එම සේවාව ලබා ගැනීමට පෙර එම ගාස්තුව අලව්ව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි."

උපලේඛන අංක 1

| | 1 වැනි තීරුව | 2 වැනි තීරුව ඉන්ධන සහිතව රු. ශත | 3 වන තීරුව ඉන්ධන රහිතව රු. ශත |
|---|---|---|---|
| 01. | මෝටර් ග්‍රේඩරය (NWZA - 5298) - මීටර් පැයකට | 7,550 0 | 4,110 0 |
| 02. | J.C.B. (බැකෝ ලෝඩරය) (NWZA - 5067) මීටර් පැයකට | 6,000 0 | 2,555 0 |

**උපලේඛන අංක 2**

| | 1 වැනි තීරුව | 2 වැනි තීරුව රු. ශත |
|---|---|---|
| 01. | ටිපර් රථය (LL - 6946) - කිලෝමීටරයක් සඳහා | 360 0 |
| 02. | ස්ථාවර ගාස්තුව (පැය 10ක් සඳහා) | 14,000 0 |

07 - 173/13

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 363 යටතේ මම තීරණය කරමි. එනම්,

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී අලව්ව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අලව්ව ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුව 2024 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්,

තව ද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක් (1%) බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම යෝජනා කරමි.

උපලේඛනය

| | *I* වැනි තීරුව | *II* වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | ලැගුම් නිවාසයක් සහ නවාතැන්පළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බත්කඩයක් හෝ ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කිරි වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ආහාර නිපදවීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ඇඳුම් පිරිසිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සංචාරක වෙළෙඳාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගවගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පෞද්ගලික වෙළෙඳපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් සහ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**අප්‍රසන්න ව්‍යාපාර :**

| | | | | |
|---|---|---|---|---|
| 1. | මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | සම්පදම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සම් විකිණීමට තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | උම්බලකඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | පශු වෛද්‍ය ශිලන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 12. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දුම්කොල වියලීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පුන්නක්කු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සත්ව මාංශ හෝ ලේ පැසවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 300 0 | 500 0 | 1,000 0 |
| 19. | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රස කැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පොල්ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | දැව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බේකින් පවුඩර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ගෑස් මැන්ටල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | පොටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I* වැනි තීරුව | | *II* වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 54. | වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පොහොර, හුණුපිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| | ***අන්තරාදායක ව්‍යාපාර :*** | | | |
| 1. | කළුගල් කැණීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | එළවළු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | පොල්තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තේ පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | හිරිගල් හෝ හුණු ගල් කැණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | විසිරි පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ උපකරණ නිපදවීම) | 500 0 | 750 0 | 1,000 0 |
| | ***අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :*** | | | |
| 1. | තලාතු මිනිරන් සුද්ධ කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තෙල් හෝ සත්ව මේද නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |

| | *I* වැනි තීරුව | *II* වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 8. | ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මෝරතෙල් සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෝට්ටු තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලෝහ වර්ග පෑස්සවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මෝටර් වාහන බෝඩි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | විෂබීජ නාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මදුරු දඟර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ප්ලාස්ටික් කුඩු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | පරණ යකඩ එකතු කිරීම සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | බොරළු කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | වැලි සේදීමේ ස්ථානයක් (පස් සේදීමෙන් වැලි ලබාගැනීමේ) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | එල්. පී. ගෑස් ගබඩා කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

07 - 173/14

---

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 350 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, 2024 අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි 11 වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී බද්ද 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, මම යෝජනා කරමි.

*උපලේඛනය*

| 1 වැනි තීරුව | 11 වැනි තීරුව | | |
|---|---|---|---|
| *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. වීදුරු උපයෝගී කරගන්නා භාණ්ඩ නිපදවීම සඳහා | | | |
| 02. වෙස්මුහුණු කැපීම සහ විකිණීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 03. බ්‍රේක් ලයිනර් නිපදවීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 04. සපත්තු නිෂ්පාදනය කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 05. මැටි භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 06. ඇඳුම් මහන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 07. හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 08. කොහු ලණු ඇඹරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. රෙදි පාපිසි නිෂ්පාදනය සහ අලෙවිය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 10. පපඩම් නිෂ්පාදනය සහ අලෙවිය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 11. සුරුට්ටු සහ බීඩි නිෂ්පාදනය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 12. යකඩ කම්මලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 13. කපු පුළුන් නිපදවීම හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. කම්බි ඇණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. පැස්ටල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. මෙට්ටා නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. ගල් ස්මාරක සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. කජු මද සකස් කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. පැලට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. බිම්මල් වගාව, පැකට් කිරීම සහ අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. පරිඝනක මෘදුකාංග නිෂ්පාදනය කිරීමේ සහ අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 365 යටතේ මම තීරණය කරමි. එනම්,

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023.05.09 දින තීරණ අංක 365 යටතේ මම තීරණය කරමි. එනම්,

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2023 ජූනි මස 19 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ යම් ව්‍යාපාරයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත පළමු උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය. එකී බද්ද 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, මම යෝජනා කරමි.

***උපලේඛනය I***

| *1 වැනි තීරුව* | *11 වැනි තීරුව* |
|---|---|
| *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ආදායම* | *ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
| 01. රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක | නැත |
| 02. රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 06. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 5,000 0 |

07 - 173/16

**ගම්පොල නගර සභාව**

2023 වර්ෂය සඳහා රථ වාහන නවතා තැබීමේ ගාස්තු පැනවීම

ගම්පොල නගර සභාව මගින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 4:1:XVIII යටතේ පහත දැක්වෙන යොජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. එම්. සමන්ත අරුන කුමාර,
සභාපති,
ගම්පොල නගර සභාව.

2023 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින,
ගම්පොල නගර සභා ශාලාවේ දී.

**යෝජනාව**

ගම්පොල නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ප්‍රධාන වීදි වල නවතා තබනු ලබන වාහන සහ නගර සභාව විසින් වෙන් කර ඇති බෝගහ අසල රථ ගාලේ නවතා තබනු ලබන වාහන සඳහා පහත උපලේඛනයේ පරිදි රථ වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීමට ගම්පොළ නගර සභාව යෝජනා කරන්නීය.

| | *නගර සභාව පිළිගත් නැවතුම් පළක මසකට (රු.)* | *අනෙකුත් ස්ථානවල දෛනිකව පැය 1කට (රු.)* | *වාර්ෂික ගාස්තු (රු.)* |
|---|---|---|---|
| I. බස් රථය | 300.00 | 80.00 | - |
| II. ලොරි/ට්‍රැක්ටර්ය | 500.00 | 80.00 | - |
| III. වෑන්/කාර්/කැබ් | 500.00 | 50.00 | - |
| IV. ට්‍රැක්ටර් | 250.00 | 80.00 | - |
| V. ත්‍රීරෝද රථ | - | 30.00 | 2,500.00 |
| VI. මෝටර් සයිකලය | 100.00 | 20.00 | - |

රජය මගින් නියම කරන ලද බදු මුදල් වේ නම් එයද මේ සමග ගෙවිය යුතුය.

07-200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.